**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2010**

## 01. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1. <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එකී මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>

#### 1.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>

**(අ)** 2007 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී අවසන් වූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින රු:19,578,120 ක් වූ වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කිරීමක සිදුකර නොතිබුණි.

#### 1.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල වූ රු.105,586ක් වූ පුනරාවර්තන වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2008, 2009 හා 2010 වර්ෂ වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වූ රු.71,150ක වූ රඳවා ගැනීමේ බදු මුදල සෘජුවම කොන්ත්‍රාත්කරු වෙතට ගෙවා තිබූ අතර, එය තවදුරටත් ගෙවිය යුතු බදු මුදලක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) 2004 මාර්තු 12 දින රු.34,500කට මිලදී ගන්නා ලද වායුසමීකරණ යන්ත්‍රය, වායුසමීකරණ වත්කම් පිළිබඳ උපලේඛනයෙහි දෙවරක් සටහන් කර තිබුණි.

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

2009 නොවැම්බර් 26 දින සිට අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරිණයක ගෙන් අධිකාරයට අයවිය යුතු වූ රු.49,899 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි.

### 1.2.4 නති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (මු.රෙ) | |
| (අ). මු.රෙ 237 (ආ) හා 257 (අ) | මිලදීගත් භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට පෙර එම භාණ්ඩ ලැබී ඇති බව හා අදාල ලේඛන වල ඇතුලත් කර ඇති බවට ද සහතික ඉදිරිපත් කර නොතිබුණි |
| (ආ). මු.රෙ 702 (3) | කොන්ත්‍රාත් ගිවිසුම් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ). මු .රෙ. 754 | ඉන්වෙන්ට්‍රි පොත මුදල් වර්ෂය් අවසානයේ දී තුලනය කර නොතිබුණි. |
| (ඇ). මු.රෙ.1645 හා 1646 | දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.1,578,502 ක ඌනතාවයක් වූ අතර, ඊට අනරුපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,234,052ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.655,550 ක හිතකර වර්ධනයක් දක්නට ලැබුණි.

#### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 වර්ෂයේ ආදායම රු.58,314,830 ක් ව අතර, එය පෙර වර්ෂයේ ආදායම වූ රු.55,962,488 හා සසඳන කල රු.2,352,342 ක වැඩිවීමකි. ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාර ප්‍රදාන හා අනෙකුත් නියෝජිත ආයතන වලින් ලද ප්‍රදානයන් රු. 3,851,213 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

#### 2.1.3 අධිකාර් බලය නොලත් ගනදෙනු

2010 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවල රු.550,000ක මුදලක් මුද්‍රණ කටයුතු සඳහා ප්‍රතිපාදනය කර තිබූ අතර, වර්ෂය තුලදී 2010 වර්ෂයට අදාල දින දර්ශන මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.1,156,931 ක් වැයකර තිබුණි. කෙසේ වෙතත්, යුනිසෙෆ් ආයතනය දින දර්ශන මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.1,112,500 ක් ප්‍රතිපූරණය කිරීමට එකඟවී තිබූ නමුත් රු.720,131 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 භෞතික කාර්යය සාධනය

**(අ)** 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියෙ නීති අංශය වෙත ලැබුණු ළමා අපයෝජන තොරතුරු හා මුළු පැමිණිලි සංඛ්‍යාව 3892 ක් වූ අතර වර්ෂය තුළ නීති අංශය මගින් නියාමන කටයුතු ආරම්භ කළ ළමා අපයෝජන තොරතුරු හා පැමිණිලි සංඛ්‍යාව 3825 ක් විය.

## (ආ) අධිකාර්යට අනුයුක්ත පොළිස් ඒකකය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාර්යෙ පොළිස් ඒකකය වෙත ලැබුණු ළමා අපයෝජන තොරතුරු හා මුළු පැමිණිලි සංඛ්‍යාව 314 ක් වූ අතර වර්ෂය තුළ පොළිස් ඒකකය මගින් නියාමන කටයුතු සිදුකළ ළමා අපයෝජන හා තොරතුරු පිළිබඳ ප්‍රගතිය පහත සඳහන් පරිදි විය.

| වරදේ ස්වභාවය | වාර්තා කරන ලද පැමිණිලි හා තොරතුරු | අධිකරණය-ට වාර්තා කළ | විමර්ශනය අවසන් | අසත්‍ය | විමර්ෂණය අවසන් නොකළ | බැහැර ස්ථාන වලට යොමු කළ |
|---|---|---|---|---|---|---|
| ලිංගික අතවර | 27 | 04 | -- | 17 | 04 | 02 |
| බරපතල ලිංගික අපයෝජන | 37 | 20 | -- | 06 | 07 | 04 |
| ආරක්ෂාව හා භාරකාරත්වය | 85 | 37 | 12 | 16 | 05 | 15 |
| පුද්ගල ජාවාරම් | 09 | 04 | -- | 03 | -- | 02 |
| ස්ත්‍රී දූෂණ | 23 | 22 | -- | -- | 01 | -- |
| පහර දී තුවාල සිදුකිරීම | 31 | 01 | -- | 16 | 06 | 08 |
| භාරකාරත්වයෙන් අපහරණය කිරීම | 12 | 01 | -- | 04 | 04 | 03 |
| මෙහෙකාර සේවය | 09 | -- | -- | -- | 03 | 06 |
| ක්‍ෂුාරත්වය | 15 | 03 | -- | 03 | 03 | 06 |
| අසභ්‍ය ප්‍රකාශන ලඟ තබා ගැනීම | 04 | 02 | -- | -- | 02 | -- |
| ළමයින් පෙන්වා සිගමන් යැදීම | 03 | 02 | -- | -- | -- | 01 |
| ව්‍යාජ මවක් ලෙස පෙනී සිටීම | 02 | 02 | -- | -- | -- | -- |
| විවිධ වැරදි / පවුල් ආරවුල් / පාසල් සිදුවීම් | 57 | -- | 30 | 09 | 10 | 08 |
| එකතුව | 314 | 98 | 42 | 74 | 45 | 55 |

### 2.2.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

ඇගයීම් කමිටු හා තාක්ෂණික වාර්තා ලබා නොගෙන කොන්ත්‍රාත් ගිවිසුම් ද අත්සන් කිරීමකින් තොරව රු.1,423,000ක අවම මිලට කුරුණෑගල දිරිදරු පියස සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම 2008 අගෝස්තු 22 දින කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා 2008 දෙසැම්බර් 31 දින දක්වා රු.1,418,000 ක ගෙවීම් කර තිබුණද, කොන්ත්‍රාත්තුව අතර මග නවතා දමා තිබුණි. වැඩ අවසන් නොකර සිටීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් මේ දක්වාම ගෙන නොතිබුණි.

### 2.2.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

**(අ)** 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනතේ 8(2) (1), 11(1) හා 12(2) වගන්ති ප්‍රකාරව අනාථයෙකු බවට පත් වූ සෑම ළමයෙකුම හා යෞවනයෙකුටම කැපකරු මාපිය රැකවරණ ලබා දීමට කටයුතු කළ යුතුවේ. 2010 නොවැම්බර් මස වන විටදී කොළඹ, කලුතර, ගම්පහ, ගාල්ල, හම්බන්තොට හා මාතර යන දිස්ත්‍රික්ක 06 හි කැපකරු මාපිය ක්‍රමය යටතේ රැකවරණ අවශ්‍ය යැයි හඳුනාගත් ළමයින් ගණන 1332ක් ද යාපනය, මඩකලපුව, අම්පාර හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල සුනාමි ව්‍යසනයෙන් දෙමව්පියන් අහිමි වූ ළමුන් ගණන 1329ක් ලෙස හඳුනා ගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කැපකරු රැකවරණ ලබා දීමට කටයුතු කර තිබුණේ එකතුව 2661 ක් වූ මුළු සංඛ්‍යාවෙන් ළමුන් 264 දෙනෙකු සඳහා පමණි. එය 9.92% ක ප්‍රතිශතයකි.

**(ආ)** සුනාමියෙන් අසරණ වූ දරුවන් හට ආධාර කිරීම සඳහා දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීනගෙන් ලැබූ රු.මිලියන 29 ක ආධාර මුදලින් 2005-2006 වර්ෂවල ළමා හා යොවුන් මධ්‍යස්ථාන 7 ක් ආරම්භකර තිබුණි. 2010 වර්ෂය අවසානය වන විට මෙම සියළුම මධ්‍යස්ථාන වසා දමා තිබුණි.

**(ඇ)** හික්කඩුව ළමා හා යෞවන මධ්‍යස්ථානය 2007 ජනවාරි 01 දින සිට වසා දමා තිබුණු අතර, එවකට සිටි සභාපතිතුමියගෙ වාචික උපදෙස් මත එහි තිබුණු රු.736,691 ක් වටිනා වත්කම් පෞද්ගලික නිවෙසක නව මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට ලබා දී තිබුණි. 2007 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් දක්වා නව මධ්‍යස්ථානය ආරම්භ කිරීම හෝ වත්කම් නැවත අධිකාරියට පවරාදීමක් හෝ කර නොතිබුණි.

**(ඇ)** පදියතලාව, නුවරඑළිය හා මීගමුව යන ප්‍රදේශවල ළමා මධ්‍යස්ථාන 03ක් පිහිටුවීම සඳහා 2005 වර්ෂයේදී යුනිසෙෆ් ආධාර යටතේ රු.873,316 ක් වටිනා වත්කම් හා උපකරණ අධිකාරය වෙත ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මධ්‍යස්ථාන ආරම්භ කර නොතිබූ අතර එම වත්කම් අධිකාරයේ ප්‍රයෝජනයට ද ගෙන තිබුණි.

### 2.2.4 හඳුනාගත් පාඩු

පහත දැක්වෙන නිරීක්ෂණය කරනු ලැබේ.

සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූ ළමුන්ගේ දත්ත ගබඩාවක් ඇති කිරීම සඳහා යුනසෙෆ් ආධාර යටතේ ලැබී තිබුණු රු.47,104ක් වටිනා ලැප්ටොප් පරිගණක යන්ත්‍රය 2006 වර්ෂය තුළදී අස්ථාන ගතවී තිබුණි. 2010 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් වූ පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

### 2.2.5 කාර්ය මණ්ඩල තත්ත්වය

**(අ)** අධිකාරයේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක | 08 | 07 | 01 |
| ද්විතීයික | 79 | 76 | 03 |
| ප්‍රාථමික | 07 | 07 | - |
| | 94 | 90 | 04 |

සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම පුරප්පාඩු පියවීමට කටයුතු කර නොතිබුණි .

**(ආ)** අධිකාරයේ කලමනාකරණ තීරණ සඳහා අවශ්‍ය ප්‍රධාන තොරතුරු කැඳවීමේ ක්‍රමවේදය වන දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු සෑම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක කළ යුතු වුවත්, යාපනය හා මුලතිව් දිස්ත්‍රික්ක වල දිස්තික් ළමා සංවර්ධන කමිටු සඳහා දිස්ත්‍රික් මනෝ සමායෝජක තනතුරු 02ක පුරප්පාඩු පැවතුණි.

### 2.2.6 අභ්‍යන්තර විගණනය

අංක අයිඒඅයි/98/02 හා 1998 අගෝස්තු 03 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

## 03. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපති වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

**(අ)** ළමා හා යොවුන් මධ්‍යස්ථාන සුපරීක්ෂණය

**(ආ)** විදේශීය අරමුදල්

**(ඇ)** සුනාමි පසු විපරම් වැඩසටහන්.